(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 1(2).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2010 ජූනි මස 14 වැනි සඳුද**

---

## 2010 ජූනි මස 29 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විසර්ජන පනත් කෙටුම්පත (2010) — දෙවැනි වර කියවීම

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 6 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 6 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 28502 “කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව” වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 321,000,000 සිට<br>රු. 260,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 321,000,000 සිට<br>රු. 210,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.01.01 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් එතුමාට පැවරුන බලතල අනුව, දෙන ලද පහත දැක්වෙන අංක 7 දරන නියමය අනුමත කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 7 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "දුම්රිය දෙපාර්තමේන්තුව ගබඩා අත්තිකාරම් ගිණුම - දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.<br>රු. | 1,200,000,000<br>1,800,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු.<br>රු. | 1,200,000,000<br>700,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු.<br>රු. | 500,000,000<br>850,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.01.01 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් එතුමාට පැවරුන බලතල අනුව, දෙන ලද පහත දැක්වෙන අංක 20 දරන නියමය අනුමත කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 20 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක. 25002 "වෙනත් ආණ්ඩු වෙනුවෙන් ගෙවීම් සඳහා අත්තිකාරම් ගිණුම - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව — රු. 5,300,000 සිට රු. 4,300,000 දක්වා

(iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව — සංශෝධන නොමැත

(iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව — සංශෝධන නොමැත

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.04.22 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් එතුමාට පැවරුන බලතල අනුව, දෙන ලද පහත දැක්වෙන අංක 21 දරන නියමය අනුමත කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 21 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක. 25003 "විවිධ අත්තිකාරම් ගිණුම - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

(i) එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව — රු. 200,000,000 සිට රු. 20,000,000 දක්වා

(ii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව — රු. 560,000,000 සිට රු. 44,700,000 දක්වා

(iii) එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව — රු. 400,000,000 සිට රු. 588,000,000 දක්වා

(iv) එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව — සංශෝධන නොමැත

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.04.22 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් එතුමාට පැවරුන බලතල අනුව, දෙන ලද පහත දැක්වෙන අංක 23 දරන නියමය අනුමත කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 23 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක. 01602 "අල්ලස් වැටලීම් වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 6,000,000 සිට රු. 10,700,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.04.22 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,—විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ ආණ්ඩුවේ අනුමතිය ඇතිව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් එතුමාට පැවරුන බලතල අනුව, දෙන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(මෙම නියමයන් වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි.)

**උපලේඛනය**

(අමුණා ඇති උපලේඛනය පරිදිය.)

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය අනුව කරන විධානය

2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය යටතේ 2009 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන ආමාත්‍යතුමා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

| අනුක්‍රමික අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | ii රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | iii රජයේකටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | iv රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| 1 | නිවාස හා පොදු පහසුකම් අමාත්‍යවරයා | 12501 | - | - | - | - | 20,000,000 | 30,000,000 | 1 |
| 2 | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව | 29001 | - | - | - | - | 90,000,000 | 97,000,000 | 2 |
| 3 | අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා | 11001 | - | - | - | - | 50,000,000 | 55,000,000 | 3 |
| 4 | අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යවරයා | 16701 | - | - | - | - | 9,000,000 | 13,000,000 | 4 |
| 5 | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 21501 | - | - | - | - | 130,000,000 | 247,000,000 | 5 |
| 6 | නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යවරයා | 14501 | - | - | - | - | 15,000,000 | 21,000,000 | 8 |
| 7 | වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යවරයා | 11601 | - | - | - | - | 21,000,000 | 25,000,000 | 9 |
| 8 | ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව | 21101 | - | - | - | - | 175,000,000 | 245,000,000 | 10 |
| 9 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල | 27701 | - | - | 23,500,000 | 18,000,000 | - | - | 11 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර | 25801 | - | - | - | - | 155,000,000 | 172,000,000 | 12 |
| 11 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර | 26201 | - | - | - | - | 165,000,000 | 169,000,000 | 13 |
| 12 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම | 27301 | - | - | - | - | 120,000,000 | 142,000,000 | 14 |
| 13 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර | 27001 | - | - | 29,500,000 | 27,000,000 | 72,000,000 | 170,000,000 | 15 |
| 14 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/කච්චේරිය, කිලිනොච්චිය | 26801 | - | - | - | - | 26,000,000 | 29,000,000 | 16 |
| 15 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර | 27801 | - | - | 35,400,000 | 26,000,000 | 115,000,000 | 132,000,000 | 17 |
| 16 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොලොන්නරුව | 27501 | - | - | - | - | 73,000,000 | 74,000,000 | 18 |
| 17 | ඛනිජ තෙල් හා ඛනිජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා | 11501 | - | - | - | - | 6,500,000 | 8,200,000 | 19 |
| 18 | ශ්‍රී ලංකා නාවික හමුදාව | 22301 | - | - | - | - | 600,000,000 | 677,000,000 | 22 |
| 19 | උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව | 30501 | - | - | - | - | 5,000,000 | 6,000,000 | 24 |
| 20 | නීති කටයුතු දෙපාර්තමේන්තුව | 32301 | - | - | - | - | 1,185,000 | 1,300,000 | 25 |
| 21 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | 32401 | - | - | - | - | 1,900,000 | 8,500,000 | 26 |

අ/ක. මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා

2010 අප්‍රේල් 06 දින
කොළඹ 01.

(ආමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

## 2010 ජූනි මස 30 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0033/'10

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වන විට අප රටෙහි සම්පූර්ණ තිරිඟු පරිභෝජනය කොපමණද;

(ii) දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ප්‍රමාණය සහ ආනයනය කරන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වසර 20ක කාලය තුළ තිරිඟු වල සිල්ලර මිල ගණන් වාර්ෂික පදනමින් කොපමණද;

(iv) පාරිභෝගිකයන් දරන බර අඩු කිරීම සඳහා තිරිඟු වලට යම් කිසි ලබා දෙන්නේද;

(v) එසේ සහනාධාර ලබා දෙන්නේ නම්, මේ වන විට ලබා දී තිබෙන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආනයනය කරන ලද හෝ දේශීය වශයෙන් නිෂ්පාදනය කරන තිරිඟු පාරිභෝගිකයන්ට ලැබෙන අවස්ථාව දක්වා වූ ක්‍රියාවලිය තුළ මේ වන විට තිරිඟු මත පනවා ඇති සියලු බදු කවරේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන්, සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0034/'10

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ දක්වා විවෘත කර තිබෙන "ලක් සතොස" වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා ආයෝජනය කර ඇති ප්‍රාග්ධනය කොපමණද;

(iii) ඒ සඳහා කිසිදු ප්‍රාග්ධනයක් නොයෙදවූයේ එම වෙළඳසැල් සඳහා අවශ්‍ය ඉඩකඩ කුලියට ගත්, මිලදී ගත් හෝ අත්පත් කර ගත් ආකාරය සහ ඒ සඳහා භාණ්ඩ මිලදී ගත් ආකාරය කවරේද;

(iv) මේ දක්වා "ලක් සතොස" හි සමස්ථ වෙළඳ පිරිවැටුම කවරේද; සහ

(v) මේ දක්වා එහි සම්පූර්ණ වෙළඳ පිරිවැය, මූල්‍ය පිරිවැය සහ ශුද්ධ ලාභය හෝ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම සියලු වෙළඳසැල්වල සේවයේ නියුතු කාර්ය මණ්ඩල සහ පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) වැටුප් වශයෙන් ගෙවනු ලබන මුදල් ප්‍රමාණය සහ එක් පුද්ගලයකු සඳහා ගෙවන සාමාන්‍ය වැටුප කොපමණද

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය වසර 5 සඳහා එක් එක් වසර තුළ වාර්ෂික ලාභය හෝ අලාභය කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0035/'10

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වර්ෂ 2010 අප්‍රේල් 30 වැනි දිනට රජය මගින් ගෙවීමට නියමිත දේශීය හා විදේශීය ණය මුදල් ප්‍රමාණය (භාණ්ඩාගාර බිල්පත් ද ඇතුළුව) කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2005 සිට 2009 දක්වා වර්ෂවලදී රජය මගින් ලබා ගන්නා ලද සම්පූර්ණ ණය මුදල් ප්‍රමාණය (භාණ්ඩාගාර බිල්පත් ද ඇතුළුව) ; සහ

(ii) ඉහත සඳහන් වර්ෂවලට අදාළව ණය වාරික හා පොළී වශයෙන් දේශීය හා විදේශීය ණය වෙනුවෙන් රජය විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0067/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලාව ග්‍රාම නිලධාරි වසමේ, තලාව හංදිය, දඹරැල්ල මාර්ගයේ කි.මී. 01 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ඉරිතලා, වලවල් සෑදී, අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත් එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0068/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් දමා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරගහවල, බිංකම, මැදආර ග්‍රාම නිලධාරි වසමේ, කරගහවල, මැදආර, හිංආර මාර්ගයේ කි.මී. 05 ක දුර ප්‍රමාණයෙහි කොන්ක්‍රීට් ඉරිතලා, වලවල් සෑදී, අබලන් තත්වයක ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0069/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට මාස 08 ට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වතුකන්ද ග්‍රාම නිලධාරි වසමේ, කොලොන්ගහහේන මාර්ගයේ මීටර් 300 ක දුර ප්‍රමාණයෙහි කොන්ක්‍රීට් ඉරිතලා, වලවල් සෑදී, අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0102/'10

ගරු අජිත් කුමාර මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු කණ්ඩායමක් විසින් 2007-2008 වර්ෂයේදී රුහුණු විශ්වවිද්‍යාලය තුළ විගණනයක් සිදු කළ බව එතුමා දන්නෙහිද?

(ආ) එම විගණනයට අදාළ 2008.01.29 දිනැතිව අදාළ විගණන වාර්තාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත භාරදී තිබෙන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉහත වාර්තාව අනුව,

(i) චෝදනා එල්ල වී තිබෙන පුද්ගලයින්ගේ නම් හා තනතුරු කවරේද;

(ii) එම අයට එරෙහිව ගෙන තිබෙන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0116/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) "අපි වෙනුවෙන් අපි" අරමුදල ආරම්භ කළ දිනය සහ එහි අරමුණු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම අරමුදලට,

(i) මේ වනවිට ලැබී ඇති මුළු මුදල කොපමණද;

(ii) රජයෙන් ලබා දී ඇති මුදල කොපමණද:

(iii) රජය හැර මුදල් ලබා දුන් ආයතන හා පුදගලයින් කවරේද;

(iv) එම ආයතන හා පුද්ගලයන් ලබා දුන් මුදල් ප්‍රදානයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම අරමුදල මගින් ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති කවරේද;

(ii) ඒවාට වැයවූ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) දැනට අරමුදලේ ඉතිරිව ඇති මුදල කොපමණද;

(iv) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය කරනු ලබන කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් ගේ නම් සහ ඔවුන්ගේ තනතුරු කවරේද;

යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0119/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වර්ෂ 2005 සිට 2010 මාර්තු 31 දක්වා ශ්‍රී ලංකාවට ගෙන්වන ලද සේලයින්

(i) ප්‍රමාණය කොපමණද;

(ii) වර්ග කවරේද;

(iii) ආනයනය කිරීමට වැයවූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය දිනවල සේලයින් හිඟයක් පිළිබඳව විවිධ තොරතුරු පුවත්පත්වල පළවූ අතර එවැනි තත්ත්වයක් ඇතිවීමට හේතු කවරේද;

(ii) එවැනි තත්ත්වයක් ඇති කිරීමට යම් නිලධාරියෙකු සම්බන්ධ නම් ඔවුන්ට එරෙහිව ගත් පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0120/'10

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකාවේ ඖෂධ හිඟයක් ඇතිවී තිබෙන බවට 2010 මැයි මාසයේදී පළ වූ මාධ්‍ය වාර්තා එතුමා පිළිගන්නෙහිද?

(ආ) එම ඖෂධ හිඟයට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඖෂධ වැනි අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණවත් තරමින් තොග ගබඩාවල තිබිය යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව මගින් නිපදවන ඖෂධ වර්ග ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාවට පිටරටින් ගෙන්වන ඖෂධ වර්ග ප්‍රමාණය කොපමණද;

(iii) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ලබා ඇති පාඩුව හෝ ණය වී ඇති ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0130/'10

ගරු රොෂාන් රණසිංහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2005 වර්ෂය වන විට මෙරටේ ක්‍රියාත්මක වූ ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම නම් වශයෙන් ඒ ඒ දිස්ත්‍රික්ක අනුව කවරේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා ආරම්භ කරන ලද ග්‍රාමීය විදුලි ව්‍යාපෘතිවල නම් එක් එක් දිස්ත්‍රික්ක වශයෙන් කවරේද;

(iii) ඒ එක් එක් ව්‍යාපෘති වෙනුවෙන් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉදිරියේදී ඇති කිරීමට බලාපොරොත්තු වන ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම කවරේද;

(v) ඒ සඳහා වැය කිරීමට බලාපොරොත්තු වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0132/'10

ගරු ජානක බණ්ඩාර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් මහනුවර මැද දුම්බර වුඩ්සයිඩ් වත්තේ හෙක්ටයාර් 810.31ක ඉඩම රු.167,470ක වාර්ෂික බදුකුලියකට කොළඹ 03, සයිමන් හේවාවිතාරණ පාරේ, මරුති පුද්ගලික සමාගම වෙත ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම බදු ගිවිසුම සඳහා රජයේ තක්සේරුව හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබේද;

(ii) බදු ගිවිසුම නීත්‍යානුකූලද;

(iii) බදුකරු බදු ගිවිසුමට අනුව කටයුතු කර තිබේද;

(iv) එසේ නොමැති නම් ඊට එරෙහිව සංස්ථාව ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බදුකරු නීත්‍යානුකූලව කටයුතු කර නැත්නම්, අදාළ බදු ගිවිසුම අවලංගු කර එම ඉඩම සංස්ථාවට ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) මෙතෙක් එසේ නීත්‍යානුකූලව කටයුතු කර නොමැති නම්, ඒ පිළිබඳව වගකිවයුත්තන්ගේ නම් කවරේද;

(iii) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0134/'10

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— වරාය හා ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට වරාය ඉදිකිරීමට වැය වන සම්පූර්ණ මුදල කොපමණද;

(ii) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

(iii) මෙම වරාය ඉදිකරනු ලබන අරමුණු කවරේද;

(iv) එහි ඉදිකිරීම් අවසන් කරන්නේ කවදා ද;

(v) ඉදිකිරීම් අවසන් කිරීමෙන් පසු සැලසෙන පහසුකම් හා වාණිජමය ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0138/'10

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) නැගෙනහිර නවෝදය වැඩසටහන යටතේ, තෝරාගත් ජලාශ 24කට මිරිදිය මත්ස්‍ය පැටවුන් මුදාහල බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ මුදා හල මිරිදිය මත්ස්‍ය පැටවුන් වටිනාකම මුදලින් කොපමණද;

(ii) එකී ජලාශවලට මුදාහල මිරිදිය මත්ස්‍ය විශේෂ කවරේද;

(iii) ඉන් වාර්ෂිකව අපේක්ෂිත මිරිදිය මත්ස්‍ය අස්වැන්න කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) උතුරු වසන්තය යටතේ, තෝරාගත් ජලාශ 97කට මිරිදිය මත්ස්‍ය පැටවුන් මුදාහල බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) එසේ මුදා හල මිරිදිය මත්ස්‍ය පැටවුන්ගේ වටිනාකම මුදලින් කොපමණද;

(ii) එකී ජලාශවලට මුදාහල මිරිදිය මත්ස්‍ය විශේෂ කවරේද;

(iii) ඉන් වාර්ෂිකව අපේක්ෂිත මිරිදිය මත්ස්‍ය අස්වැන්න කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0139/'10

ගරු ඩුලිප් විජේසේකර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පස් අවුරුදු මිරිදිය මත්ස්‍ය හා ජල ජීවී නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමේ වැඩසටහන දියත් කිරීම සඳහා තෝරාගනු ලැබූ වැව් හා ජලාශ සංඛ්‍යාව කොපමණද;

(ii) එකී ජලාශවලට මුදා හැරීමට නියමිත තෝරාගත් මිරිදිය මත්ස්‍ය විශේෂ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මුදා හැරීමට නියමිත මිරිදිය මත්ස්‍යයින් හා ඉස්සන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ජලජ ජීවීන්ගේ වටිනාකම මුදලින් කොපමණද;

(iii) උක්ත ජලජ ජීවීන් මුදාහැරීමෙන් පසු, ඉන් වාර්ෂිකව අපේක්ෂිත මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් අස්වැන්න කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 ජූලි මස 01 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0002/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කිරින්ද යාල සිට රණ්මිනිතැන්න ගම්මානය දක්වා අක්කර 7000 ක භූමි භාගයක් තුළ වසර 40කට අධික කාලයක සිට ගොවි පවුල් 4500 ත් 6000 අතර ප්‍රමාණයක් හේන් ගොවිතැනින් තම ජීවිකාව රැකගන්නා බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අසරණ හේන් ගොවියන්ගේ ගොවිබිම් ඔවුන්ට අහිමි කිරීමේ සැලැස්මක් තිබේද;

(ii) එසේ නම්, එම උත්සාහය වහා නතර කරන්නට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ගොවිබිම් නිරන්තරයෙන් වල්අලින්ගේ හානියට ගොදුරු වන්නෙහිද;

(ii) එසේ නම්, මෙම හානි මගහරවා ගැනීමට ගන්නා වූ ක්‍රියා මාර්ග කවරේද;

(iii) මෙම ගොවිබිම් සඳහා ජලය, විදුලිය මංමාවත් ආදී යටිතල පහසුකම් ලබා දී ගොවි බිම් ලෙස සංවර්ධනය කර එම ගොවි බිම්වල අයිතිය ගොවීන්ට ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0007/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා ,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කිරිඳි ඔය මෝය සිට දොර ඔය මෝය දක්වා අක්කර 396ක් පුරා පැතිරුණු කිලෝමීටර් 4.05 දිග, කිලෝමීටර් 1.05 ක් පළල මීටර් 30ක් උස් වූ මාගම වැලිවැටිය ගැන එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම වැලිවැටිය නිසා කුඹුරු අක්කර 676 ක් හා අතිරේක බෝග අක්කර 31 ක ගොවිබිම් ප්‍රමාණයක් මුහුදු රළෙන් ආරක්ෂා වන බවත්;

(ii) මෙම වැලි වැටිය දකුණලකට අවේනික පළු, වීර, රණවරා යන ශාකයන්ගෙන් ආවරණය වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙම වැලි වැටිය එහි ඇති ඉල්මනයිට් සහ ගැනයිට් යන ඛණිජ ලබා ගැනීම සඳහා විදේශීය සමාගමක් වෙත පවරා ඇති බවත්;

(ii) අඩි අටක් පමණ යටින් පිහිටා ඇති මෙම ඛණිජ ලබා ගැනීමේදී පොලොව මට්ටමේ සිට ඉහලින් ඇති වැලි ස්ථරයෙන් 60% ක් පමණ ඉවත් කරනු ලබන නිසා මාගම සහ අවට ගම්මානවලට අහිතකර බලපෑම් ඇති වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, එම අහිතකර බලපෑම් මගහරවා ගැනිම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රදේශයේ ජනතාවගේ කැමැත්ත විමසා බැලීමක් ව්‍යාපෘති කමිටුව මඟින් සිදුකර තිබේද;

(iii) ජනතා විරෝධතා මධ්‍යයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ නම් එසේ කරන ලද්දේ කාගේ මග පෙන්වීමක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0070/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වසරකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වතුකන්ද ග්‍රාම නිලධාරී වසමේ, වතුකන්ද, වලකඩකන්ද මාර්ගයේ මීටර් 150 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ගැලවී අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0009/'10

ගරු රවී කරුණානායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වන සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ණය ලබාගත් විදේශ ආයතනය හා අදාළ ණය ප්‍රමාණය කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතිය යටතේ මිනුම් සිදුකොට සිතියම්ගත කිරීමට ඉලක්ක කළ කැලෑ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) සිතියම්ගත කළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) ඊට වැයකළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ව්‍යාපෘතිය යටතේ උපදේශකවරුන් ලෙස බඳවාගත් විදේශිකයින් සඳහා ගෙවූ මුදල කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතිය යටතේ විදේශ සංචාර කළ අය කවුරුන්ද;

(iii) එම විදේශ සංචාර සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) උක්ත ව්‍යාපෘතිය යටතේ වනාන්තරවල මායිම් සඳහා ගන්නා ලද කොන්ක්‍රීට් මායිම් කණු සංඛ්‍යාව හා වැය කළ මුදල කොපමණද;

(ii) ඉතිරිව ඇති කණු සංඛ්‍යාව කොපමණද;

(iii) අවශ්‍ය සංඛ්‍යාව සමග සංසන්දනය කිරීමේදී ඉතිරිවන කණු සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම ව්‍යාපෘතියේ සිතියම්ගත කිරීම් හා යොදාගන්නා ලද මායිම් කණු සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අනුමතිය ලැබී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0015/'10

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා ගෙන් ඇසීමට,—

(අ) (i) 2008 වර්ෂයේ සිට මේ දක්වා දිවයින පුරා වාර්ෂිකව සිදු වී ඇති රිය අනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින්, මාරක රිය අනතුරු සංඛ්‍යාව හා සාමාන්‍ය රිය අනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම රිය අනතුරු අතුරින් අධික වේගයෙන් ධාවනය කිරීම හේතුවෙන් සහ මත්ද්‍රව්‍ය ගැනීමෙන් පසු රිය ධාවනය කිරීම හේතුවෙන් සිදුවී ඇති අනතුරු සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම අනතුරු හේතුවෙන් මියගිය හා තුවාල ලැබූ හෝ ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙසේ දිවයින පුරා සිදුවන රිය අනතුරු වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0036/'10

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඉදිකිරීම් පිරිවැය සමග;

(ii) කිරිබත්ගොඩ, නුගේගොඩ, දෙහිවල, කඩවත, කොට්ටාව සහ ඔරුගොඩවත්ත යන ප්‍රදේශවල ඉදිකරන ලද එක් එක් ගුවන් පාලමෙහි දිග හා වර්ගඵලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ගුවන් පාලම් සාමාන්‍ය සිමෙන්ති යොදා කරන ඉදිකිරීමක් ලෙස ඉදිකරන ලද්දේ නම්, එම එක් එක් ගුවන් පාලම සඳහා වැය වන ඉදිකිරීම් පිරිවැය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ඉදිකිරීම් වලට අදාලව ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) ටෙන්ඩර් කැඳවා තිබේ නම්, ලැබී ඇති තරඟකාරී මිල ගනන් කවරේද;

(iii) මෙම ඉදිකිරීම් සඳහා අරමුදල් ලැබුණු මූලාශ්‍ර කවරේද;

(iv) ඒ සඳහා වැය වූ සමස්ත පිරිවැය සහ එම ණය මුදලට ගෙවිය යුතු පොලිය කවරේද;

(v) එකී ණය මුදල ආපසු ගෙවිය යුතු කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

0024/'10

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පාසල් සිසුන් සඳහා ඉංග්‍රීසි, දෙමළ හා ජපන් භාෂා ඉගැන්වීමට 'ග්‍රාමීය අධ්‍යාපන සංවර්ධන ඇකඩමිය' නම් වූ ආයතනයක් දකුණු පළාත ඇතුළු පළාත් කිහිපයක ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද ?

(ආ) (i) දකුණු පළාත තුළ ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන පාසල් කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අනෙකුත් පළාත් සහ පාසල් කවරේද;

(iii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ වලින් එම ආයතනයට අනුමැතිය ලබා දී තිබේද;

(iv) ඒ කවර දිනයන් හි දී, කවුරුන් විසින්, කවර කොන්දේසි යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ව්‍යාපෘතිය යටතේ සිසුන්ගෙන් මුදල් අය කරන්නේ නම්, එක් සිසුවෙකුගෙන් අයකරන මුදල කොපමණද;

(ii) අධ්‍යාපන අමාත්‍යාංශය හෝ රජයේ වෙනත් ආයතනයක් විසින් ඊට අනුමැතිය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0025/'10

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පාසල් සිසුන් සඳහා ඉංග්‍රීසි, දෙමළ හා ජපන් භාෂා ඉගැන්වීමට 'ග්‍රාමීය අධ්‍යාපන සංවර්ධන ඇකඩමිය' නම් වූ ආයතනයක් මගින් දකුණු පළාත ඇතුළු පලාත් ගනනාවක ක්‍රියාත්මක ව්‍යාපෘතියට ගුරුවරුන් බඳවා ගැනීමේ දී අනුගමනය කරන ක්‍රමවේදය කුමක්ද;

(ii) එම ගුරුවරුන් ඉංග්‍රීසි, දෙමළ හෝ ජපන් ආදී භාෂා ඉගැන්වීමට සුදුසු අය බවට පිළිගත හැකි සහතිකයක් තිබේද;

(iii) මෙම ව්‍යාපෘතිය රාජ්‍ය ආයතනයක් මඟින් අධීක්ෂණය කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවුරුන් විසින්ද;

(v) අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියක් ලබා හෝ නොලබා තිබුණද අදාළ කොන්දේසි අනුව කටයුතු කර නැත්නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0026/'10

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2011 වසර උසස් පෙළ විභාගයට පෙනී සිටීම සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් දේශපාලන විද්‍යාව හා කෘෂිකර්මය විෂයන් හදාරන සිසුන් සඳහා විෂය නිර්දේශ සකස් කර තිබේද;

(ii) එසේ නම්, ඒවා පාසල්වල ඉගැන්වීමට යොදා ගන්නේද;

(iii) නොඑසේ නම්, ඉංග්‍රීසි මාධ්‍යයෙන් එම විෂයන් හදාරන සිසුන් විභාගය සඳහා ඉදිරිපත් කරනු ලබන්නේ කවර විෂය නිර්දේශයක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0131/'10

ගරු රොෂාන් රණසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මෙරට මෙතෙක් පුරන්ව තිබූ කුඹුරු ප්‍රමාණයෙන් "අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ 2008 - 2010 කාලය තුළ දී නැවත වගා කරන ලද කුඹුරු ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කයන්හි වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එසේ වගා කිරීමෙන් 2008 - 2010 කාලය තුළ එක් එක් කන්නයේ දී නිෂ්පාදනය කරන ලද වී ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කයන්හි වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ පුරන්ව තිබූ කුඹුරු වගාකිරීමෙන් ලත් අස්වැන්න නිසා ජාතික ආර්ථිකයට ඇති කරන ලද දායකත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0133/'10

ගරු ජානක බණ්ඩාර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයට අයත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ, මට්ටක්කුලිය, මෝදර ගබඩාව සංකීර්ණය, අක්කර 07යි රූඩ් 02යි පර්චස් 05ක ප්‍රමාණය කෝපොර්ට් පුද්ගලික සමාගමට, මාසික කුලිය රු.65317/- ක මුදලකට බදු දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අදාළ ගිවිසුම සඳහා රජයේ තක්සේරුව හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබේද;

(ii) අදාළ බදුකරු විසින් බදු ගිවිසුමට අනුව නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(iii) නීත්‍යානුකූලව කටයුතු කර නැත්නම් නැවත එම අදාළ ගබඩාව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) මෙතෙක් එසේ නීත්‍යානුකූලව කටයුතු කර නොමැති නම් ඒ පිළිබඳව වග කිවයුත්තන්ගේ නම් කවරේද;

(v) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0140/'10

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ජාතික වනෝද්‍යාන සංඛ්‍යාව කොපමණද;

(ii) 2007, 2008, 2009 වර්ෂ තුළ ජාතික වනෝද්‍යාන ඉපැයූ ආදායම වෙන් වෙන් වශයෙන් කොමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට, රිදියගම සෆාරි උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීමට නියමිත මුළු භූමි ප්‍රමාණය කොමපමණද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට අපේක්ෂිත දිනය කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0141/'10

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කිළිනොච්චිය විදුලි බලාගාරය ප්‍රතිසංස්කරණය කිරීමේ පළමු හා දෙවන අදියරයන් සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් අදියර අවසානයේ දී නිෂ්පාදනයට අපේක්ෂිත මුළු විදුලි ඒකක ගණන මෙගා වොට් කොපමණද?;

(iii) එයින් ලබදීමට අපේක්ෂිත නව විදුලි සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

(iv) ප්‍රතිසංස්කරණය නිම කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වවුනියාව සිට චුන්නකුලම් දක්වා විදුලි සම්ප්‍රේෂණය නගා සිටුවීමේ ව්‍යාපෘතියේ ප්‍රථම හා දෙවන අදියරයන් සඳහා ඇස්තමේන්තුගත මුළු වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ප්‍රථම හා දෙවන අදියර යටතේ විදුලි සම්ප්‍රේෂණයට නියමිත දුර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0143/'10

ගරු අචල ජාගොඩගේ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 642 නැගෙනහිර ගලපාත ග්‍රාම සේවා වසමට අයත්, කිඹුලවිල කන්ද ජනපදයේ ජලයෝපනා ක්‍රමය,

(i) ආරම්භ කරන ලද වර්ෂය කුමක්ද;

(ii) ක්‍රියාත්මක කිරීමට අධාර ලබා දුන් බැංකුව කුමක්ද;

(iii) ඒ සඳහා ලැබුණු ආධාර මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම මඟින් ප්‍රතිලාභ සැලසීමට අරමුණු කරගත් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම ජල යෝජනා ක්‍රමය අසාර්ථකවීද;

(iii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0146/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ග්‍රාමීය ජනතාවගේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා ගම නැගුම වැඩ සටහන ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැඩ සටහන යටතේ 2009 වර්ෂයේ දී කුරුණෑගල දිස්ත්‍රික්කයට ලබා දුන් මුදල කොපමණද?

(ii) එමගින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) ගම නැගුම වැඩ සටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයට 2010 වසර සඳහා ප්‍රතිපාදන ලබා දී තිබේද?

(iv) එසේ නම්, එම මුදල කොපමණද?

(v) ඒ යටතේ දැනට ව්‍යාපෘති ආරම්භ කර තිබේද;

(vi) එසේ නම්, එම ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 ජූලි මස 02 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0071/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වල්ගම්මුල්ල ග්‍රාම නිලධාරී වසමේ, වල්ගම්මුල්ල කොන්කරහේන මාර්ගයේ මීටර් 250 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ගැලවී වලවල් සෑදී අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත් එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0072/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට මාස හතකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සපුතන්ත්‍රිකන්ද ග්‍රාම නිලධාරී වසමේ, නාවලේබොක්ක මාර්ගයේ කි.මී. ¾ ක දුර ප්‍රමාණයෙහි කොන්ක්‍රීට් ගැලවී සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0073/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගලහිටිය දකුණ ග්‍රාම නිලධාරී වසමේ, තුන්මුල්ලහේන, මගහේන මාර්ගයේ කි.මී. 01 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ඉරිතැලී, පුපුරා ගොස්, අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0037/'10

ගරු රවී කරුණානායක මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) අප රටේ ධීවරයින් විශාල සංඛ්‍යාවක් විදේශ රටවල අත්අඩංගුවේ පසුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2005 ජනවාරි මාසයේ සිට මේ දක්වා කාලය තුළ විදේශ රටවල් විසින් අත්අඩංගුවට ගනු ලැබූ ධීවරයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් මේ වනවිට විදේශ රටවල අත්අඩංගුවේ පසුවන ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0096/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට

(අ) (i) 1948 වර්ෂයේ සිට 1994 වර්ෂය දක්වා එක් එක් වර්ෂය අවසාන වන විට; සහ

(ii) 1995 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා එක් එක් වර්ෂය අවසානයේ හා 2010 වර්ෂයේ මේ දක්වා;

ගෙවීමට තිබූ සමස්ථ රාජ්‍ය ණය ප්‍රමාණය දේශීය ණය සහ විදේශීය ණය ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (i) හි සහ (ii) හි සඳහන් කාලපරිච්ඡේදයන්හි එක් එක් වර්ෂය සඳහා මුළු ණය ක්‍රමක්ෂය (මුල් මුදල + පොලිය වශයෙන් ගෙවූ මුදල) කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 1948 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය, 2003 වර්ෂය, 2004 වර්ෂය, 2005 වර්ෂය, 2006 වර්ෂය, 2007 වර්ෂය සහ 2008 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලපරිච්ඡේදය යන කාල වකවානු සඳහා,

(i) ලෝක බැංකුව
(ii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
(iii) ආසියානු සංවර්ධන බැංකුව
(iv) ජපන් ජාත්‍යන්තර සහයෝගීතා බැංකුව
(v) ඇමෙරිකා එක්සත් ජනපදය
(vi) ජපානය
(vii) යුරෝපා සංගමයේ (EU)රටවල්
(viii) ඉන්දියාව
(ix) චීනය

යන සංවිධාන සහ රටවල් වෙත ගෙවිය යුතුව තිබූ මුළු ණය ප්‍රමාණයන්, ඒ සඳහා වන සාමාන්‍ය පොලී වියදමද සමගින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) එමෙන්ම පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂය සඳහා ඒක පුද්ගල ආදායම සමග සන්සන්දනාත්මකව ඒක පුද්ගල ණය බර ප්‍රමාණයන් ද එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0092/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) එකතු කිරීමට අපේක්ෂා කරන ලද සමස්ථ සෘජු බදු ප්‍රමාණය කොපමණද;

(ii) එකතු කිරීමට අපේක්ෂා කරන ලද සමස්ථ බදු ප්‍රමාණයෙන් එකතු කරගත් සහ එකතු කර නොගත් බදු ප්‍රමාණය කොපමණද;

(iii) එකතු කර නොගත් බදු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) අදාළ බලධාරීන්ට ත්‍යාග ලෙස ගෙවූ මුදල් ප්‍රමාණය කොපමණද; සහ

(v) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන බදු ලිපිගොනු සංඛ්‍යාව කොපමණද;

යන්න පසුගිය වසර 05 සඳහා වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) සෑම වසරකම දෙසැම්බර් 31 දිනට ගෙවීමට නියමිත වැට් බදු, නිෂ්පාදන බදු, හර බදු, ගුවන්තොටුපල සහ වරාය බදු ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත බදුවලින් එකතු කර ගත් සහ එකතු කර නොගත් ප්‍රමාණය කොපමණද; සහ

(iii) එකතු කර නොගත් බදු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න පසුගිය වසර 05 සඳහා වාර්ෂික පදනමින් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉදිරි වසර 3 සඳහා සෘජු බදු, වැට් බදු සහ ගුවන් තොටුපල සහ වරාය බදු යටතේ එකතු කිරීමට අපේක්ෂිත බදු ප්‍රමාණය කොපමණ ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0144/'10

ගරු අචල ජාගොඩගේ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතිය දියත් කිරීමේ අරමුණ කවරේද;

(ii) එයින් ප්‍රතිලාභ අපේක්ෂිත පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාල ජල සම්පාදන ව්‍යාපෘතියේ පළමු සහ දෙවන අදියරයන් සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ ආරම්භක දිනය කවරේද;

(iii) එය නිම කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0145/'10

ගරු අචල ජාගොඩගේ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2009 වර්ෂය අවසානයේ දී වාර්තාගත අලි සහ ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2009 වර්ෂය තුළ අලි-මිනිස් ගැටුම්වලින් මියගිය අලි සහ ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2009 වර්ෂය තුළ අලි සහ ඇතුන් පහරදීමෙන් මියගිය මිනිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අලි - මිනිස් ගැටුම අවම කිරීම සඳහා යෝජිත වැඩ පිළිවෙලක් තිබේද;

(ii) එසේ නම්, එය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0147/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ඉඩම් ප්‍රමාණය අතරින් යම් කොටසක් දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැරව පැවති බවත්;

(ii) එම සමහර ඉඩම්වල වසර 40කට වඩා වැඩි කාලයක් ජනතාව ස්ථිරව පදිංචි වී සිටින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) නැවත එම ඉඩම් දෙපාර්තමේන්තු පාලනය යටතට ගැනීමට සූදානමක් තිබේද;

(iii) එසේ නම්, පදිංචි වී සිටින පවුල් සම්බන්ධයෙන් ගන්නා වූ සාධාරණ ක්‍රියා මාර්ගය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0148/'10

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මකවන දැදුරු ඔය වාරි ව්‍යාපෘතිය පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා රජය වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) එම ව්‍යාපෘතියේ ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) දැදුරු ඔය ව්‍යාපෘතිය මගින් පමණක් කුරුණෑගල දිස්ත්‍රික් ගොවි ජනතාවගේ ජල ප්‍රශ්නය විසඳීමට නොහැකි බව එතුමා පිළිගන්නෙහිද;

(ඈ) එසේ නම්, වෙනත් වැඩ පිළිවෙලක් සකසා තිබේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0142/'10

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) බද්දේගම, මාකුරුගොඩ පිහිටි වූ තරුණ කටයුතු හා ක්‍රීඩා සංවර්ධන මධ්‍යස්ථානයට අයත්,

(i) ඉඩම් වපසරිය කොපමණද;

(ii) ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගොඩනැගිලි කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(ii) එහි නඩත්තු කටයුතු සඳහා පත්කර ඇති සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0151/'10

ගරු වයි. ජී. පද්මසිරි මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හරිත සංචාරක කර්මාන්ත සංකල්පයේ අරමුණු කවරේද;

(ii) එම යෝජිත ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇති ගම්මාන කවරේද;

(iii) එම ගම්මාන තෝරා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අදාළ ව්‍යාපෘතිය යටතේ, එක් එක් ගම්මානය සංවර්ධනයට ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0054/'10

ගරු ඒ. විනායගමූර්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) උතුරු පළාතේ භූමි ප්‍රමාණයෙන් 35% පමණ වූ වලිකාමම් උතුරු ප්‍රදේශය අධි ආරක්ෂිත කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ප්‍රකාශයට පත් කිරීම සිදු කළ දිනය කවරේද; සහ

(ii) එවැනි ප්‍රකාශයට පත් කිරීමක් මෙම පාර්ලිමේන්තුවෙන් අනුමත කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0114/'10

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දීගාමඩුල්ල දිස්ත්‍රික්කයේ අම්පාර මැතිවරණ කොට්ඨාසය තුළ,

(i) ජාතික ජල සම්පාදන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කර ඇති පානීය ප්‍රජා ජල යෝජනා ක්‍රම කවරේද;

(ii) එම එක් එක් ජල යෝජනා ක්‍රමය ආරම්භ කළ දිනයන් කවරේද;

(iii) ඒවා මගින් පානීය ජලය සපයන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ජලය ලබා දී ඇත්තේ කවදා සිටද:

(v) ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති ලබා දිය හැකි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(vi) එම ව්‍යාපෘති ලබා දීමට කටයුතු කරන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0268/'10

ගරු රවුෆ් හකීම් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මහජනයාගේ ප්‍රවාහන පහසුකම් සැලසීමට කුලී පදනම යටතේ ධාවනයට යොදවා ඇති ත්‍රීවීල් රථ සඳහා රජය මගින් ලබාදෙන රු.1500/= ක මාසික ඉන්ධන සහනාධාරය ලැබීමට මේ වන ලියාපදිංචි වී ඇති මහනුවර දිස්ත්‍රික්කයේ ත්‍රීවීල් රථ හිමියන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතුරින් එම ඉන්ධන සහනාධාර ලබාදී ඇති ත්‍රීවීල් රථ හිමියන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම්, ලිපිනයන්, ත්‍රීවීල් රථ අංක සහ එම සහනාධාර පළමුව නිකුත් කල දිනයන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, වෙන වෙනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 ජූලි මස 03 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0005/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගොවිජන කේන්ද්‍ර බල ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බල ප්‍රදේශ කවරේද;

(iii) ගොවිජන කෙන්ද්‍ර මට්ටමින් සිටින අඳ ගොවියන් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අඳ ගොවියන්ගේ ලිපිනයන් ඇතුළු නාම ලේඛණයක් ගොවිජන කෙන්ද්‍ර මට්ටමින් ලබා දීමට එතුමා කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0074/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට මාස 08 ට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පාතේගම ග්‍රාම නිලධාරී වසමේ, පාතේගම, හඳුගල මාර්ගයේ මීටර් 600 ක දුර ප්‍රමාණයෙහි කොන්ක්‍රීට් ඉරිතලා, වලවල් සෑදී, අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0075/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාලිගාතැන්න ග්‍රාම නිලධාරී වසමේ, පොතේවෙල, පෝතකඩ මාර්ගය මීටර් 200 ක දුර ප්‍රමාණයෙහි දැනට කොන්ක්‍රීට් ගැලවී සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0093/'10

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ඇඟලුම් කර්මාන්තයට අයත් කර්මාන්තශාලා ගණන වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් කර්මාන්තශාලාව විවෘත කරන අවස්ථාවේ ඒවායෙහි සිටි සමස්ථ ශ්‍රම බලකාය කොපමණද;

(iii) දැනට ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව සහ අද වන විට ඒවායෙහි වැඩ කරන සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වසා දමා ඇති කර්මාන්තශාලා විවෘත කිරීම පිණිස යොදාගෙන ඇති ක්‍රියාකාරී සැළසුම් කවරේද;

(v) 2004 සිට 2010 දක්වා කාලය තුල එක් එක් වර්ෂයෙහි අපනයනය කළ ඇඟලුම් ප්‍රමාණය සහ සමස්ථ ඉපයීම් වල වටිනාකම ශ්‍රී ලංකා රුපියල් සහ එක්සත් ජනපද ඩොලර් වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(vi) ශ්‍රී ලංකාවේ තිබෙන රෙදි නිෂ්පාදන කර්මාන්තශාලා සංඛ්‍යාව සහ ඒවායෙහි නිෂ්පාදන ධාරිතාවත්, වියන ලද හෝ ගොතන ලද වයනය අනුව රෙදි වර්ගත් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0094/'10

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාස 15 තුල සිටින සමෘද්ධිලාභීන් සංඛ්‍යාව 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ සෑම වර්ෂයකම ජුනි මස 30 වන දිනට කොපමණද;

(ii) ඉහත පවුල් වලට ලැබෙන සමෘද්ධි දීමනාවේ ප්‍රමාණය අනුව ඔවුන් අයත්වන කාණ්ඩයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004, 2005, 2006, 2007, 2008 සහ 2009 වර්ෂයත් සඳහා උද්ධමන අගය කවරේද;

(ii) 2004 පාදක වර්ෂය ලෙස ගෙන 2010 දක්වා වූ පසුව එළඹෙන වර්ෂවලදී උද්ධමනය අඩු කල විට සමෘද්ධිලාභීන් ලැබූ දීමනාවෙහි මූර්ත වටිනාකම කවරේද;

(iii) සමෘද්ධිලාභීන්ගේ ක්‍රය ශක්තිය අඩු වී ඇති බව එමගින් පෙන්නුම් කෙරෙන්නේද;

(iv) ඉහත සඳහන් කරුණ නිසා ඇතිවූ ප්‍රතිඵලයක් ලෙස එවන් සමෘද්ධිලාභීන් අතර දරිද්‍රතාව වැඩිවී තිබේද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0095/'10

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන සහ ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2010.06.01 දිනට කැබිනට් අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් හට ගෙවූ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය භුක්ති විඳින අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0115/'10

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එක් එක් ග්‍රාම නිලධාරී වසම තුළ,

(i) පදිංචි පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉඩම් දීමනා පත්‍ර ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට ඉඩම් දීමනා පත්‍ර ලබා දීමට යෝජිත, ලිපිගොනු සකස් කොට ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන්, එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම දීමනා පත්‍ර ලබා දීමට කොපමණ කාලයක් ගතවන්නේද;

(ii) එම කටයුතු කඩිනම් කිරීම සම්බන්ධයෙන් එතුමා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0101/'10

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2004 සිට 2010 වර්ෂය දක්වා වූ කාල සීමාවේදී, එක් එක් වර්ෂයේදී සමස්ත ශ්‍රී ලංකාව තුළ දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන්,

(i) ක්‍රියාත්මක වූ පාසල්, පිරිවෙන් සහ උපකෘත පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) වසා දමන ලද පාසල්, පිරිවෙන් සහ උපකෘත පාසල් සංඛ්‍යාව සහ ඒවා කවරේද;

(iii) ආරම්භ කරන ලද පාසල්, පිරිවෙන් සහ උපකෘත පාසල් සංඛ්‍යාව සහ ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 සිට 2010 දක්වා කාලසීමාවේදී ශ්‍රී ලංකාව තුළ පාසල් වසා දැමීමට හේතුවූ කරුණු මොනවාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0118/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දිගාමඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉස්මායිල්පුරම් ගම්මානයේ වෛද්‍ය පහසුකම් නොමැති හේතුවෙන් එහි ජනතාව විවිධ දුෂ්කරතාවයන්ට මුහුණදෙන බවත් ;

(ii) එම ජනතාවට හදිසි වෛද්‍ය සේවාවන් ලබාගැනීමට පවා අම්පාර, සමන්තුරේ වැනි දුර බැහැර ප්‍රදේශවලට යාමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) රටේ සෑම ගමකම අඩු තරමින් එක් ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථානයක් හෝ තිබෙන තත්වයක් තුළ මෙම ඉස්මායිල්පුරම් ගමට එවැනි පහසුකමක් හෝ ලබාදීමට කඩිනමින් පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0135/'10

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදාවට අමෙරිකාවේ ටෙක්සාස් ප්‍රාන්තයේ පිහිටි බ්‍රිටිෂ් බෝර්නියෝ ඩිෆෙන්ස් සමාගම මගින් අවි ආයුධ හෝ වෙනත් භාණ්ඩ ආනයනය කර තිබේ ද;

(ii) එසේ ආනයනය කර ඇත්නම්, ඒ වෙනුවෙන් දරා ඇති වියදම එක් එක් වර්ෂය සඳහා වෙන වෙනම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම සමාගමේ හිමිකරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේ ද;

(ii) එම හිමිකරුවන් සහ ශ්‍රී ලංකා යුද හමුදාවට සම්බන්ධ නිලධාරීන් අතර කිසියම් සම්බන්ධතාවයක් තිබේ ද;

(iii) එසේ නම්, එවැනි සම්බන්ධතාවයක් ඇති අයගේ නම් කවරේ ද;

(iv) එවැනි සම්බන්ධතාවයක් අදාළ සමාගම සමහ තිබේ නම්, ඒ පිළිබඳව ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0136/'10

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඇමෙරිකාවේ ලියාපදිංචි කරන ලද හයිකෝප් ඉන්ටර්නැෂනල් සමාගම විසින් ශ්‍රී ලංකා යුද හමුදාවට යුද උපකරණ හෝ වෙනත් භාණ්ඩ මිලදී ගෙන තිබේ ද;

(ii) එසේ මිල දී ගත්තේ නම්, ඒවා මොනවාද;

(iii) මෙම සමාගමේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම භාණ්ඩ මිලදී ගෙන ඇත්තේ ටෙන්ඩර් පටිපාටියක් යටතේ ද;

(v) නොඑසේ නම්, එම මිලදී ගැනීම් සම්බන්ධව වගකිවයුත්තන්ගේ නම් කවරේද;

(vi) ඔවුන් සම්බන්ධයෙන් අනුගමනය කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ගය කවරේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0137/'10

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2002 වසර වන විට යාපනයේ හමුදා මූලස්ථානවලින් ලබාගත් විදේශීය දුරකථන ඇමතුම් වෙනුවෙන් රු. 2,018,331.00 ක හිඟ මුදලක් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට ගෙවීමට තිබූ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) මෙම බිල්පත් නොපියවීම සම්බන්ධව ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම නීත්‍යානුකූලව කටයුතු කළ බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) මේ වන විට එම හිඟ මුදල පියවීමට කටයුතු කර තිබේ ද;

(ii) එසේ නම්, ඒ කුමන අරමුදලකින්ද;

(iii) ඒ සඳහා අනුමැතිය ලබාදුන් අයගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0263/'10

ගරු රවුෆ් හකීම් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ගාල්ල මහ නගර සභා සීමාවේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත්, මොහිදීන් වත්ත නිවාස යෝජනා ක්‍රමයේ, නිල වශයෙන් පදිංචි පවුල් සංඛ්‍යාව කොමණද;

(ii) එම පදිංචිකරුවනගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 20කට අධික කාලයක සිට මොහිදීන් වත්ත නිවාස යෝජනා ක්‍රමයේ ඉහත ස්ථිර පදිංචිකරුවන්ගේ නිවාස සඳහා හිමිකම් බලපත්‍ර (ඔප්පු) මෙතෙක් ලබා දී නොමැති බව එතුමා දන්නේද;

(ii) එම ස්ථිර පදිංචිකරුවන් වෙත හිමිකම් බලපත්‍ර (ඔප්පු) නොපමාව ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 37/'10

ගරු රවි කරුණානායක මහතා

ගරු රන්ජන් රාමනායක මහතා

ගරු එච්.එම්.එම්. හරීස් මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු අර්ජුන රණතුංග මහතා

ගරු නිමල් විජේසිංහ මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු ජේ. ශ්‍රී රංගා මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— රට පුරා පවතින අත්‍යාවශ්‍ය ඖෂධ වල උග්‍ර හිඟය පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

අත්‍යාවශ්‍ය ඖෂධවල උග්‍ර හිඟයක් රට පුරා පවතින හෙයින් ද,

මෙම හිඟය සඳහා හේතු ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා පාර්ලිමේන්තුවේදී හෙළිදරව් කර ඇති හෙයින් ද,

මෙම තත්වය නිවැරදි කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග කඩිනමින් නොගතහොත්, මහත් ව්‍යසනයක් ඇතිවිය හැකි හෙයින් ද,

(අ) මෙම ඖෂධ හිඟය සඳහා හේතු විමසා බැලීම සඳහාත්;

(ආ) මෙම තත්වයෙන් මිදීම සඳහා අවශ්‍ය කෙටි කාලීන ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහාත්;

(ඇ) අනාගතයේ මෙබඳු තත්වයක් යළි ඇතිවීම වැළැක්වීමට ගතයුතු ස්ථිර ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහාත්;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන් ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට ද, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, ලේඛනයක් හෝ වාර්තා ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අනාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ එම කාර්ය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු හෝ සහතික කරනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහය පිණිස අදාළ ක්ෂෙත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමට ; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද රැස්වීම් පවත්වාගෙන යැමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස 6ක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 38/'10

ගරු රවී කරුණානායක මහතා

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා

ගරු ජේ. ශ්‍රී රංගා මහතා

ගරු රන්ජන් රාමනායක මහතා

ගරු හරින් ප්‍රනාන්දු මහතා

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු අර්ජුන රණතුංග මහතා

ගරු නිමල් විජේසිංහ මහතා,— කොළඹ නගරය හා තදාසන්න ප්‍රදේශ වල යළි යළිත් ජල ගැලීම් ඇති වීමට හේතු සොයා බලා වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

පසුගිය දින ගණනාවක් තුළ කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ වැඩි කොටසක් සහ කොළඹ දිස්ත්‍රික්කයේ විශාල කොටස් තදබල ජල ගැලීම් වලට ගොදුරු වී ඇති හෙයින් ද,

මෙය, කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය සහ දිස්ත්‍රික්කය තුළ වෙසෙන පුරවැසියන්ගේ ජීවිත වල නිරන්තරයෙන් යළි යළිත් ඇතිවන ලක්ෂණයක් බවට පත්ව ඇති හෙයින් ද,

මේ පිළිබඳ වගකීම ඇත්තවුන් මෙම තත්ත්වය පාලනය කිරීමට කිසිදු ප්‍රයත්නයක් දරා නොමැති හෙයින් ද,

මෙම ජල ගැලීම් යළි යළිත් ඇතිවීම වැළැක්වීම පිණිස කිසිදු ක්‍රියාමාර්ගයක් ගනු ලැබ නොමැති හෙයින් ද,

කාලයත් සමඟ තත්ත්වය වඩ වඩාත් නරක අතට හැරී ඇති හෙයින් ද,

ජල ගැල්ම පහව යාමෙන් පසුව සියළු දෙයම අමතක කර දැමීමේ ප්‍රවණතාවක් ඇති හෙයින් ද,

මෙය ඉතාමත් අසතුටුදායක තත්ත්වයක් වන හෙයින් ද,

(අ) කොළඹ නගරයේ හා ඒ අවටද, එම දිස්ත්‍රික්කයේ ද යළි යළිත් ජල ගැලීම් ඇතිවීමට හේතු විමසා බැලීමට ද;

(ආ) ඉහත කී පරිදි ජල ගැලීම් ඇති වීම වැළැක්වීමට අවශ්‍ය ක්ෂණික හා කෙටි කාලීන ක්‍රියා මාර්ග පිළිබඳව විමසා බැලීමට ද;

(ඇ) මෙම ගැටළුව යළි යළිත් ඇතිවීම ස්ථිරව ම වැළැක්වීමේ ක්‍රම සහ විධි නිර්දේශ කිරීමට ද;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට ද, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ ඒ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු හෝ සහතික කරවනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ හා ප්‍රවීනයන්ගේ සහාය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද රැස්වීම් පවත්වාගෙන යැමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස 6ක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

පා. 58/'10

ගරු කරු ජයසූරිය මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා

ගරු රවි කරුණානායක මහතා

ගරු ජේ. ශ්‍රී රංගා මහතා,— මැතිවරණ නීති සමාලෝචනය කිරීම හා සංශෝධන නිර්දේශ කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පසුගිය වර්ෂ ගණනාවක් මුළුල්ලේ විවිධාකාර ප්‍රයත්නයන් දරා ඇති හෙයින්ද,

5 වැනි පාර්ලිමේන්තුව කාලයේදී හා ඉන් අනතුරුව 2006, 6 වැනි පාර්ලිමේන්තුව කාලයේදී ද ඇතුළුව, අවස්ථා ගණනාවකදී මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳව විමසා බැලීම සඳහා විශේෂ කාරක සභා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

මෙම කාරක සභා විසින් අන්තර්වාර වාර්තා ගණනාවක් ඉදිරිපත් කරනු ලැබ ඇති හෙයින් ද,

මෙම කාරක සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති හෙයින් ද,

(අ) මැතිවරණ සම්බන්ධ නීති, විශේෂයෙන්ම ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ පනත, පළාත් පාලන මැතිවරණ පනත, පළාත් සභා මැතිවරණ පනත, පාර්ලිමේන්තු මැතිවරණ පනත සහ ජනාධිපති මැතිවරණ පනත හා සමඟ ඉහත කී පනත්වලට වසර ගණනාවක් පුරා සිදුකරන ලද විවිධ සංශෝධනද ඉහත දක්වා ඇති පනත්වල විධිවිධාන වලට අදාළ කරන ලද විශේෂ විධිවිධාන පනත් කෙටුම්පත්ද සමාලෝචනය කිරීමටත්;

(ආ) මෙම පනත් ප්‍රතිශෝධනය කිරීමට, සංශෝධනය කිරීමට හා ඒකාබද්ධ කිරීමට ඇති අවශ්‍යතාව තක්සේරු කිරීමටත්;

(ඇ) මැතිවරණවලට අදාළව දැනට පවත්නා නීති වලට අවශ්‍ය ප්‍රතිසංස්කරණ සහ සංශෝධන නිර්දේශ කිරීමටත්;

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධාන වල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) යම් තැනැත්තෙකු කැඳවීමට, යම් ලේඛන හෝ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට හා එබඳු තැනැත්තෙකු සන්තකයෙහි හෝ පාලනය යටතේ පවතින යම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂිකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට හා කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරවනු ලැබූ සාක්ෂිකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීනයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යෑමට ද;

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට වර්ෂයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබා දෙන අන් කවර කාල සීමාවක් තුළ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.